කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම. කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම. කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම. කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම.

# කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම.

## දෙවන වාර පරීක්ෂණය 2019, මාර්තු

13 ශ්‍රේණිය

**ගිණුම්කරණය II** | 33 | S | II | පැය තුනයි

සැලකිය යුතුය :-
- පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.

01. සිමිත අංජන පොදු සමාගමේ 2018. 03. 31 දිනට ශේෂ පිරික්සුම පහත පරිදි විය.

ශේෂ පිරික්සුම (රු. 000)

| | හර | බැර |
|---|---|---|
| දේපල පිරියත හා උපකරණ | 8 000 | |
| විකුණුම් පිරිවැය | 8 000 | |
| 18. 03. 31 තොගය පිරිවැය | 1 200 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 800 | |
| ස්ථාවර තැන්පතු | 2 430 | |
| මුදල් හා මුදල් සමාන දෑ | 4 600 | |
| වැටුප් | 1 200 | |
| විදුලිය | 250 | |
| විකුණුම් වියදම් | 100 | |
| ගොඩනැගිලි රක්ෂණය | 130 | |
| මෝටර් රථ රක්ෂණය | 50 | |
| ආදායම් බදු | 300 | |
| අතුරු ලාභාංශ | 210 | |
| 17. 04. 01 ට දේපළ පිරියත හා උපකරණ සමු. ක්ෂය | | 450 |
| 18. 03. 31 ලබාගත් බැංකු ණය | | 2 000 |
| ප්‍රකාශිත සා. කොටස්. ප්‍රාග්ධනය | | 8 000 |
| 17. 04. 01 ට රඳවාගත් ඉපැයුම් | | 3 200 |
| 17. 04. 01 ට ගොඩනැගිලි ප්‍රත්‍යාගණන සංචිත | | 600 |
| විකුණුම් | | 13 800 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 1 220 |
| ආයෝජන | 2 000 | |
| | 29 270 | 29 270 |

පහත අතිරේක තොරතුරු සපයා ඇත.

1. 2018. 03. 31 දිනට පැවති තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු. 1 050 000 කි.
2. රු. 200 000 ක ගැනුම් ඉන්වොයිසියක් පොත් වලින් මග හැරී ඇත.
3. ස්ථාවර තැන්පතුව 18. 01. 31 ආරම්භ කරන ලද අතර එහි කල් පිරීමේ කාලසීමාව මාස 06 කි. තැන්පතු සඳහා මේ වර්ෂයට ලැබිය යුතු පොලි ආදායම රු. 20 කි.
4. සේවා අර්ථසාධක අරමුදල (EPF) සඳහා සේව්‍ය හා සේවක දායකයන් පිළිවෙලින් 15% ක් හා 10% ක් වන අතර සේවක භාරකාර අරමුදල සඳහා සේව්‍ය දායකය 3% කි. මේ සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නැති අතර ශේෂ පිරික්සුමේ දළ වැටුප දක්වා ඇත.
5. 18. 03. 31 දිනට උපචිත විදුලිය 20 000 කි.
6. සමාගමේ දේපල පිරියත හා උපකරණ පිළිබඳ තොරතුරු පහත දක්වේ.

| අයිතමය | පිරිවැය/ප්‍රත්‍යාගණිත අගය | 17. 04. 01 ට සමුච්චිතය ක්ෂය |
|---|---|---|
| ඉඩම් | 2 800 | |
| ගොඩනැගිලි | 3 000 | |
| මෝටර් රථ | 1 500 | 300 |
| කාර්යාල උපකරණ | 700 | 150 |
| | 8 000 | 450 |

www.artsapi.lk

ගොඩගැනිලි 2018. 03. 31 දෙවන වරට රු. 2050 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. මේ සම්බන්ධයෙන් කිසිවක් සටහන් කර නොමැත. දේපල පිරියත හා උපකරණ පහත පරිදි ක්ෂය කළ යුතුය.

| | |
|---|---|
| ගොඩනැගිලි ප්‍රත්‍යාගණිත අගයට | 5% |
| මෝටර් රථ පිරිවැයට | 20% |
| කාර්යාලය උපකරණ පිරිවැය | 10% |

මෝටර් රථ භාණ්ඩ බෙදාහැරීමේ කටයුතු සඳහා භාවිත කරයි.

07. බැංකු ණය සඳහා ඉදිරි වසර තුල රු. 400 000 ක් ගෙවිය යුතු අතර ඉතිරි මුදල ඊළග වසර 3 ක් තුල ගෙවිය යුතුය.
08. වර්ෂය තුල හිමිකම් නිකුතුවක් කර ඇති අතර එහි මුළු වටිනාකම රු. 800 000 කි. එය නිසි පරිදි ගිණුම්ගත කර ඇත.
09. සමාගමට විරුද්ධව පාරිභෝගිකයකු විසින් නඩුවක් පවරා තිබු අතර එහි තීන්දුව අධිකරණය විසින් ලබාදුන් අතර ඊට අනුව පාරිභෝගිකයාට රු. 250 000 ක වන්දියක් ගෙවිය යුතුය.
10. 2018. 06. 01 දින අධ්‍යක්ෂවරු විසින් සමාගමේ මූල්‍ය ප්‍රකාශ අනුමත කරන ලදී.
11. 2018. 03. 31 දිනට මුදල් පොතට අනුව බැංකු ශේෂය හා බැංකු ප්‍රකාශනයට අනුව බැංකු ශේෂය එකිනෙකට සමාන නොවු අතර වෙනසට හේතු වු කරුණු පහත පරිදි දැක්විය හැක.
    a. රු. 30 000 ක ණයගැති සෘජු ප්‍රේෂණ මුදල් පොතේ සටහන් නොවීම.
    b. රු. 40 000 ක බැංකු ගාස්තු මුදල් පොතේ සටහන් නොවීම.
12. ප්‍රවර්තන වර්ෂයේ ආදායම් බද්ද බදු පෙර ලාභයෙන් 1/4 ක් ලෙස ඇස්තමේන්තු කල යුතු ය.

අවශ්‍ය වන්නේ, ප්‍රසිද්ධ කිරීම සඳහා සටහන්ද ඇතුළුව
1. 18. 03. 31 න් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශන.
2. 18. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
3. 18. 03. 31 න් අවසන් වසර සඳහා හිමිකම වෙනස්වීම් ප්‍රකාශනය

(ලකුණු 20)

02. අ. සීමිත හෙලන්කා පොදු සමාගම විදුලි පංකා නිෂ්පාදන සමාගමකි. මෙය නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකකින් හා සේවා දෙපාර්තමේන්තුවකින් සමන්විත වේ. එම සමාගමේ පොදු කාර්ය පිරිවැය සම්බන්ධයෙන් පහතතොරතුරු සපයා ඇත.

i.

| විස්තරය | එකලස් | නිමවුම් | ගබඩා |
|---|---|---|---|
| යන්ත්‍ර උපකරණ (පිරිවැය - රු. 000) | 1 250 | 700 | 50 |
| බිම් ප්‍රමාණය - වර්ග මීටර | 300 000 | 150 000 | 50 000 |
| සේවක සංඛ්‍යාව | 30 | 15 | 5 |
| සෘජු ශ්‍රමය - පැය | 37 000 | 33 500 | - |

ii.

| අනෙකුත් පොදු කාර්ය පිරිවැය | රු. 000 |
|---|---|
| යන්ත්‍ර උපකරණ ක්ෂය | 2 000 |
| ගෙවල් කුලී හා විදුලිය | 200 |
| සේවක සුභ සාධක වියදම් | 150 |

iii. වෙනත් තොරතුරු

| පිරිවැය | නිෂ්පාදන දෙපාර්තමේන්තු | | සේවා දෙපාර්තමේන්තුව |
|---|---|---|---|
| | එකලස් | නිමැවම් | ගබඩා |
| වක්‍ර ද්‍රව්‍ය | 480 | 180 | 30 |
| වක්‍ර වේතන | 360 | 120 | 20 |
| වක්‍ර වියදම් | 60 | 40 | 20 |

www.artsapi.lk

සේවා දෙපාර්තමේන්තුව නිෂ්පාදන දෙපාර්තමේන්තු සඳහා සමානව සේවා සපයයි.
නිෂ්පාදන ඒකකයකට අදාල සෘජු වියදම් පිළිබඳ ඇස්තමේන්තු පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| සෘජු ද්‍රව්‍ය | $A_1$ | 400 |
| | $A_2$ | 250 |
| සෘජු ශ්‍රමය | - | පැය 8 - පැයකට රු. 80/= |
| | | නිමවුම් පැය 6 - පැයකට රු. 60/= |
| සෘජු වියදම් | - | රු 50/= |

නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය සෘජු ශ්‍රම පැය පදනම මත අන්තර් ග්‍රහණය කෙරේ.
භාණ්ඩයේ විකුණුම් මිල පිරිවැයට 20% ක ලාභාන්තිකයක් සහිතව තීරණය කරයි.

අවශ්‍ය වන්නේ,

1. පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව (සේවා අංශයේ පොදු කාර්ය පිරිවැය නැවත විභජනයද සහිතව)
2. සෘජු ශ්‍රම පැය පදනම මත නිෂ්පාදන දෙපාර්තමේන්තු සඳහා පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත
3. විදුලි පංකාවක මුළු නිශ්පාදන පිරිවැය
4. විදුලි පංකාවක විකුණුම් මිල

(ලකුණු 10)

ආ. විරංගී මුද්‍රණ ආයතනය සතුව පවතින ඡායා පිටපත් යන්ත්‍රයක් ඉදිරි මාස තුන ඇතුලත භාවිතයෙන් ඉවත් කළ යුතු වේ. මේ සඳහා නව යන්ත්‍ර දෙකක් මිල දී ගැනීමට යෝජිත අතර යන්ත්‍ර දෙකෙහිම ඵලදායී ජීව කාලය වසර 5 බැගින් වේ. යන්ත්‍ර දෙක පිළිබඳ ඇස්තමේන්තු ගත තොරතුරු පහත පරිදි වේ.

| | A | B |
|---|---|---|
| යන්ත්‍රයේ ගැනුම් මිල | රු. 355 000 | 395 000 |
| යන්ත්‍ර ගෙන ඒමේ පිරිවැය | රු. 5 000 | 5 000 |
| සුන්බුන් අගය | රු. 40 000 | 50 000 |
| එක් ඡායා පිටපතක් සඳහා වන විචල්‍ය පිරි වැය | රු. 1. 50 | 1. 00 |
| එක් ඡයා පිටපතක් සඳහා අය කරන ගාස්තුව | රු. 6. 00 | 6. 00 |

♦ වසර පහ තුල මෙම යන්ත්‍රවලින් ලබා ගැනීමට අපේක්ෂා කරන ඡායා පිටපත් සංඛ්‍යාවක් මෙසේ ය.

| වසර | A | B |
|---|---|---|
| 1 | 30 000 | 34 000 |
| 2 | 36 000 | 42 000 |
| 3 | 40 000 | 38 000 |
| 4 | 38 000 | 34 000 |
| 5 | 20 000 | 22 000 |

♦ ඇස්තමේන්තු ගත වාර්ෂික පොදු කාර්යය පිරිවැය රු. 800 000 කි. 10% ක අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය (වට්ටම් සාධකය) පහත දක්වේ.

| වර්ෂය | 0 | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|---|
| මට්ටම් සාධකය | 1 | 0.9 | 0.8 | 0.7 | 0.6 | 0.5 |

අවශ්‍ය වන්නේ,

1. එක් එක් යන්ත්‍රයෙහි පිළිගෙවුම් කාලය ගණනය කිරීම.
2. ගණනය කරන ලද පිළිගෙවුම් කාලය මත පදනම්ව විරංගි විසින් මිල දී ගත යුත්තේ කිනම් යන්ත්‍රය දැයි හේතු සහිතව දැක්වීම.

(ලකුණු 5)

www.artsapi.lk

ඉ. සීමිත දුලන්යා පොදු සමාගමේ වැටුප් ගෙවීම් වලට අදාල තොරතුරු පහත දක්වේ.

- ♦ මාසික වැටුප් ලබන සේවකයන්ගේ මූලික වැටුප දිනකට පැය 8 බැගින් වැඩ කරන දින 20 කි.
- ♦ අතිකාල පැයක ගෙවීම් සාමාන්‍ය වැටුප් අනුපාතය මෙන් 150% කි.
- ♦ සේවක අර්ථ සාධක අරමුදල් දායකය මූලික වැටුප මත පදනම් වන අතර සේවකයා 10% ක් ද, සේව්‍යයා 15% ක් ද සේවක භාරකාර අරමුදල් දායක සේව්‍යයා 3% ක් ගෙවයි.
- ♦ සෑම මසකම අවසාන දින වැටුප් ගෙවන අතර සේවක අර්ථසාධක හා භාරකාර අරමුදල් ඊළඟ මස 10 දින යවනු ලැබේ.

2019 ජනවාරි මාසයට අදාල සේවක වැටුප් සම්බන්ධ තොරතුරු පහත දක්වේ.

| සේවකයාගේ නම | මූලික වැටුප (රු) | වැඩකල පැය | ණයවාරික (රු) |
|---|---|---|---|
| සමීර | 15 600 (මාසික) | 190 | 2 500 |
| තුෂාන් | 16 000 (මාසික) | 150 | 1 300 |
| නිලාන් | 8 0 (පැයකට) | 165 | - |

අවශ්‍ය වන්නේ,

1. පහත ආකෘතියට යොදා ගනිමින් 2019 ජනවාරි මාසය සඳහා වැටුප් ලේඛනය

| සේවකයාගේ නම | එකතු කිරීම් | | | අඩු කිරීම් | | | ශුද්ධ ණය | සේව්‍යයා | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | මූලික වැටුප | අතිකාල දීමනා | දළ වැටුප | සේවක අර්ථ සාධක | ණය වාරික | මුල් අඩු කිරීම් | | සේවක අර්ථ සාධක | සේවක භාරකාර අරමුදල |
| | | | | | | | | | |

2. වැටුප් හා වේතන පාලන ගිණුම
ගෙවිය යුතු සේවක අර්ථ සාධක අරමුදල් ගිණුම
ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් ගිණුම

(ලකුණු 05)

03. අ. ගිම්හානි සමාගමේ 2018. 12. 01 දිනට වත්කම් වගකීම් පහත දක්වා ඇත.

| වත්කම් | | වගකීම් | |
|---|---|---|---|
| ගොඩනැගිලි පරිව්‍යයට | 460 000 | වෙළඳ ගෙවිය යුතු දෑ | 60 000 |
| සමුච්චිත ක්ෂය | (230 000) | | |
| තොගය | 20 000 | | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 45 000 | | |
| අතැති මුදල් | 5 000 | | |

පහත දක්වෙන ගනුදෙණු 2018 දෙසැම්බර් මාසය තුල සිදු වී ඇත.

1. රු. 200 000 ක් වටිනා භාණ්ඩ ව්‍යාපාරය විසින් ණයට ගෙන ඇත.
2. ව්‍යාපාරයේ ණයට විකුණුම් රු. 200 000 කි. මේවායේ පිරිවැය රු. 160 000 කි.
3. රු. 20 000 ක් වැටුප් ලෙසත්, 30 000 ක් පරිපාලන වියදම් ලෙසත් ගෙවන ලදී.
4. ආයතනය ගොඩනැගිලි පිරිවැය මත වසරකට 10% බැගින් ක්ෂය කරයි.
5. ණයගැතියන්ගෙන් ස්ථිර ලෙසටම නොලැබේ යැයි දන ගන්නට ලැබී ඇති මුදල රු. 8 000 කි.
6. රු. 200 000 ක ණයගැතියෙක් තම ණය පියවීම සඳහා 10%ක වට්ටමකට යටත්ව මුදල් ගෙවන ලදි.
7. ගිම්හානි තම පෞද්ගලික මුදල් වැය කර රු. 10 000 ක ණයහිමියෙක් පියවන ලදී.
8. ආයතනය නව මුහුණුවරකින් නවිකරණය කිරීම සඳහා ගිම්හානි ලබාගත් බැංකු ණය මුදල රු. 200 000 කි.
9. ගිම්හානි තම දියණියගේ මංගල උත්සව වියදම් ලෙස රු. 40 000 ක් ව්‍යාපාරයේ මුදලින් ගෙවන ලදී.

www.artsapi.lk

අවශ්‍ය වන්නේ,
1. දෙසැම්බර් 01 දිනට ගිණුම්කරණ සමීකරණයේ පිහිටීම දක්වන්න.
2. ඉහත සඳහන් ගනුදෙණු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය වටිනාකම් සහිතව දක්වන්න.

පිළිතුරු සැපයීමේ දී පහත ආකෘතිය භාවිත කරන්න.

| ගනුදෙණු | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| 2018. 12. 01<br>ශේෂය<br>1<br>2 | | | |

(ලකුණු 10)

ආ. සිමිත බන්ටි සමාගමේ 2017. 04. 01 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ නිරූපණය කරන ලද ණයගැති ශේෂය 450 000 ක් විය.
2018. 03. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ ණයගැති ලේජරයේ සාරාංශය පහත දැක්වේ.

| | රු. 000 | | |
|---|---|---|---|
| | අනු. | මිනු. | බිනු. |
| 2017. 04. 01 දිනට ශේෂය | 200 | 80 | 130 |
| විකුණුම් | 1 000 | 600 | 550 |
| මුදල් ලැබීම් | (850) | (480) | (560) |
| ආපසු එවුම් | (60) | - | (40) |
| දුන් වට්ටම | (20 | (25) | (10) |
| බොල් ණය නැවත ලැබීම | (15) | - | - |
| ණයහිමි ශේෂ මාරු කිරීම | - | (5 | - |
| 18. 03. 31 | 255 | 170 | 70 |

අමතර කරුණු,
1. කාලච්ඡේදය තුල බිනුට කළ රු. 40 000 ක විකුණුම් ණයගැති ලෙජරයේ සටහන් කර නොමැත.
2. අනුට සිදුකල රු. 30 000ක අත් පිට විකුණුම් අනුගේ පෞද්ගලික ගිණුමේ විකුණුම් ලෙස හරකර ඇති අතර ණයගැති පාලන ගිණුමේ මුදල් ලැබීම් ලෙස බැරකර ඇත.
3. පෙර වසරක අනු වෙනුවෙන් බොල් ණය ලෙස කපා හරින ලද 15 000 ක මුදලක් මෙම වසෙර් දි මුදලින් ලද අතර එය ණයගැති පාලන ගිණුමට බැර කර මුදල් ගිණුම හරකර ඇත.
4. ණයහිමි ශේෂ මාරු කිරීම ණයගැති පාලන ගිණුමේ සටහන් කොට නොමැත.
5. බිනුට පිරිනැමූ රු. 10 000 ක දුන්වට්ටම් තුල 5 000 ක වෙළෙඳ වට්ටමක් ද ඇතුලත් විය. නමුත් වෙළෙඳ වට්ටම පාලන ගිණුමේ වාර්තා කර නොමැත.
6. ආපසු එවුම් සඳහා ජනල් සටහන් තබා නැත.
7. විකුණුම් ජර්නලය 50 000 ක් අඩු වෙන් එකතු කොට ඇත.
8. 2017. 04. 30 දින හෘද රෝගයක් හේතුවෙන් බිනු මිය ගිය අතර ඔහුගෙන් අයකර ගැනීමට තිබූ ශේෂය අයකර ගත නොහැකි බව තහවුරු කර ගන්නා ලදි. සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2018. 06. 30 දින අධ්‍යක්ෂවරුන්ගේ අනුමැතිය ලබා ගැනීමට යොමු කළ අතර 2018. 07. 10 දින ඒවාට අනුමැති ලැබුනි. මේ සම්බන්ධයෙන් කිසිඳු සටහන් තබා නොමැත.
   1. වැරදි නිවැරදි කිරීමට පෙර ණයගැති පාලන ගිණුමේ ශේෂය
   2. සංශෝධිත ණයගැති පාලන ගිණුම
   3. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2018. 03. 31 දිනට දැක්විය යුතු ණයගැති ශේෂය.

(ලකුණු 10)

www.artsapi.lk

04. අ. ස/ස රන්මුතු සුභ සාධක සංගමයේ ගිණුම් පොත්වලින් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

1. 2017. 04. 01 දිනෙන් අවසන් වර්ෂය වෙනුවෙන් රු. 150 00 ක මුදලක් ලී බඩු හා සවිකිරීම් මිලට ගැනීම වෙනුවෙන් පරිත්‍යාග ලෙස ලැබී ඇත. මෙයින් රු. 60 000 ක් පමණක් ලී බඩු මිලට ගැනීම සඳහා 2018. 01. 01 දින යොදා ගෙන ඇත.
2. 2017/2018 වසර සඳහා එක් අයකුට සාමාජික ගාස්තුව 5 000 කි. සංගමයේ සාමාජිකයන් 100 ක් ලියාපදිංචි වී සිටි.
3. ගිණුම් ශේෂ රු (000)

| ගිණුම් ශේෂ රු (000) | 2018. 03. 31 | 2017. 04. 01 |
|---|---|---|
| දේපළ පිරියත (ධාරණ අගය) | 900 | 1000 |
| බැංකු මුදල් | ? | (30) |
| කලින් ලද සාමාජික මුදල් | 20 | 10 |
| ලැබිය යුතු සාමාජික මුදල් | 15 | 45 |

4. 2017/18 වර්ෂයේ මුදලින් කරන ලද ගෙවීම් මෙසේය.

| | රු. |
|---|---|
| දේපල මිලට ගැනිම | 250 000 |
| මෙහෙයුම් වියදම් | 45 000 |
| 12% ස්ථාවර තැන්පතු | 60 000 |
| ආරක්ෂක ගාස්තු | 50 000 |
| විදුලිය වියදම් | 15 000 |
| ගමන් වියදම් | 10 000 |

අවශ්‍ය වන්නේ,
1. 2017. 04. 01 දිනට සමුච්චිත අරමුදල
2. 2017/18 වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය
3. 2018. 03. 31 දිනට බැංකු ගිණුම් ශේෂය
4. 2018. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

(ලකුණු 10)

ආ. කොහු ආශ්‍රිත නිෂ්පාදනයක් සිදු කරනු ලබන ආරියපාල සමාගම එම නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය බාහිර සැපයුම්කරුවන්ගෙන් ලබා ගනියි. ඇස්තමේන්තු වලට අනුව මෙම අමුද්‍රවයේ උපරිම පරිභෝජනය මසකට ඒකක 1 500 ක් ද අවම පරිභෝජනය මසකට ඒකක 500 ක් ද වේ. තවද උපරිම ඇණවුම් කාලය මාස 4 ක් වන අතර අවම ඇණවුම් කාලය මාස 2 කි. ආර්ථික ඇණවුම් ප්‍රමාණය ඒකක 4 000 කි.

අවශ්‍ය වන්නේ පහත සඳහන් දෑ ගණනය කිරීම.
1. යළි ඇණවුම් මට්ටම
2. අවම තොග මට්ටම
3. උපරිම තොග මට්ටම
4. සාමාන්‍ය තොග මට්ටම

(ලකුණු 5)

ඉ. සීමිත ශානිකා පොදු සමාගමේ මෝටර් රථ සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ.

| මෝටර් රථ අංකය | මිල දී ගත් දිනය | 2017. 04. 01 දිනට ධාරන අගය (000) | සුන්බුන් අගය රු. 000 | 2017. 04. 01 දිනට සමුච්චිත ක්ෂය (000) |
|---|---|---|---|---|
| 1 | 3015. 04. 01 | 4 200 | 200 | 2000 |
| 2 | 2015. 07. 01 | 3 850 | 600 | 1 750 |
| 3 | 2017. 01. 01 | 7 050 | 400 | 350 |
| | | 15 100 | | 4 100 |

අතිරේක තොරතුරු,
1. සමාගම මෝටර් රථ සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි
2. 2018. 03. 31 දින අංක 1 මෝටර් රථය රු. 4500 000 කට විකුණන ලදී.
3. 2018. 04. 01 දින සමාගම සතු මෝටර් රථ පහත අගයන්ට ප්‍රත්‍යාගණනය කරන ලදී.

www.artsapi.lk

| මෝටර් රථ (අංකය) | ප්‍රත්‍යාගණන අගය (රු. 000) |
|---|---|
| 2 | 3 800 |
| 3 | 5 000 |

අවශ්‍ය වන්නේ,

1. 2018. 03. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත ගිණුම්

   a. මෝටර් රථ  b. මෝටර් රථ සමුච්චිත ක්ෂය

   b. මෝටර් රථ ක්ෂය  d. මෝටර් ඉවත් කිරීම

2. ප්‍රත්‍යාගණනය මගින් ඇති වූ ප්‍රත්‍යාගණන ලාභය හෝ අලාභය

(ලකුණු 5)

05. i.අ. ආශා හා නීෂා 3 : 2 අනුපාතයට ලාභ අලාභ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක නිරත වූහ. 2017. 03. 31 දිනට ව්‍යාපාරයෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පහත දැක්වේ.

ආශා හා නීෂා හවුල් ව්‍යාපාරය
2017. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | | |
|---|---|---|
| | | රු. 000 |
| දේපල පිරියත හා උපකරණ | | 250 |
| ජංගම වත්කම් | | 130 |
| | | 380 |
| ප්‍රාග්ධන ගිනුම් | | |
| ආශා | 180 | |
| නීෂා | 90 | 270 |
| ජංගම ගිනුම් | | |
| ආශා | 18 | |
| නීෂා | 12 | 30 |
| ජංගම නොවන වගකීම් | | 50 |
| ජංගම වගකීම් | | 30 |
| | | 380 |

ii. 2017. 04. 01 දින ලාභයෙන් 1/6 ක් සඳහා ඊෂා ව්‍යාපාරයට බඳවා ගන්නා ලදී.
ඊෂා ප්‍රාග්ධනය ලෙස රු. 100 000/= ක් ව්‍යාපාරයට රැගෙන ආවේය. 2018. 03. 31 න් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයෙහි ශුද්ධ ලාභය 154 500/= ක් වූ අතර පහත ගැලපීම් කිරීමට පෙර මෙම ලාභය ගණනය කොට තිබුණි.

1. ආශාගේ රු. 3 000/= ක පුද්ගලික රක්ෂණ වාරිකය ව්‍යාපාරය විසින් දරා ඇත.
2. නීශා සිය පුද්ගලික මුදලින් රු. 5 000/= ක ව්‍යාපාරික රක්ෂණ ගාස්තු ගෙවා තිබුණි.
3. 2018. 06. 30 න් අවසන් අර්ධ වර්ෂය සඳහා වූ රු. 12 000 ක ප්‍රචාරණ ගාස්තු කාලච්ඡේදයේ වියදමක් ලෙස සලකා ඇත.
4. නීෂා ගෙවූ විදුලි ගාස්තු 4 000/= ක් ව්‍යාපාරයෙහි වියදමක් ලෙස සලකා නොමැත.
5. මසකට රු. 3 000/= ක් ලබා දී මේ පොරොන්දුව මත ව්‍යාපාරයට යොදවා ඇති ආශාගේ ගොඩනැගිල්ල සඳහා වූ කුලිය 2018 වර්ෂයෙහි සිට 4 000/= දක්වා වැඩිකර ඇතත් ගාස්තු වැඩි වීම පිළිබඳ ගැලපීම් සිදු කොට නොමැත.
6. ජංගම නොවන වගකීම් 2017. 09. 30 දින ලබාගත් 10% බැංකු ණය වන අතර ඒ සඳහා අදාල පොලිය කාලච්ඡේදයෙහි අවසන් දින වන විටත් ගෙවා නොමැත.

නව හවුල් ගිවිසුමේ පහත කරුණු ඇතුලත්ය :-

අ. ආරම්භක ප්‍රාග්ධන ශේෂය මත හවුල් කරුවන්ට 10% වාර්ෂික පොලියක් හිමි වේ.

ආ. ආශා, නීෂා, ඊශා පිළිවෙලින් රු. 2 000/= රු. 1 500/= හා රු. 1000/= බැගින් වූ මාසික වේතන සඳහා හිමිකම් කියති.
ආශා, නීශා, ඊසා ගිණුම් කාලච්ඡේදය තුළ දී පිළිවෙලින් රු. 5000/= රු. 3 000/= හා රු. 2 000/= ක් බැගින් ගැනිලි සිදු කර ඇත.

www.artsapi.lk

අවශ්‍ය වන්නේ,

1. විසර්ජනය කල හැකි නිවැරදි ලාභය
2. හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම්
3. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුතු ජංගම වත්කම් හා ජංගම වගකීම්. (ලකුණු 10)

ආ. මන්දාරිගේ ව්‍යාපාරය VAT සඳහා ලියාපදිංචි ආයතනයක් වන අතර VAT අනුපාතය 15% කි. 2019. 01. 01 දිනට ව්‍යාපාරයේ පහත වත්කම් හා වගකීම් පැවැතුණි.

ගැනුම්, විකුණුම්, ආපසු එවුම් හා ආපසු ගැවුම් වටිනාකම් VAT රහිතව දක්වා ඇත.

| | රු. 000 |
|---|---|
| දේපල, පිරියත හා උපකරණ | 1 240 |
| තොගය | 160 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 210 |
| බැංකු | 195 |
| බැංකු ණය | 280 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 310 |
| ගෙවිය යුතු VAT | 45 |

ජනවාරි මස මුල් දෙසතිය තුළ දී පහත ගනුදෙණු සිදු වී ඇත.

i. භාණ්ඩ තොග ණයට ගැනුම් හා විකුණුම් සම්බන්ධ තොරතුරු

| දිනය | සැපයුම්කරු | ගැනුම්කරු | ගැනුම්/ විකුණුම් | ආපසු එවුම්/ ආපසු යැවුම් | මුදල් ලැබීම්/ ගෙවීම් | දුන්වට්ටම්/ ලද වට්ටම් |
|---|---|---|---|---|---|---|
| 1/1 | කසුන් | | 70 | | | |
| 1/3 | | සිසිල් | 30 | | | |
| 1/4 | කසුන් | | | 10 | | |
| 1/5 | දසුන් | | 50 | | | |
| 1/7 | | බැසිල් | 30 | | | |
| 1/8 | | සිසිල් | | 5 | | |
| 1/9 | සුපුන් | | 60 | | | |
| 1/12 | කසුන් | | | | 40 | 2 |
| 1/13 | සුපුන් | | | 10 | | |
| 1/14 | | බැසිල් | | | 20 | 1 |

www.artsapi.lk

ii. මුදල් ලැබීම් හා ගෙවීම්

| දිනය | ගැනුම් | විකුණුම් | වියදම් | ආදායම් | විවිධ |
|---|---|---|---|---|---|
| 1/2 | 50 | | | 10 (කොමිස්) | |
| 1/5 | | 40 | | 5 (විවිධ) | |
| 1/8 | | | 10 (වැටුප්) | | |
| 1/10 | | 30 | | | 12 (බැංකුණය ගෙවීම) |
| 1/11 | 70 | | 2 (දුරකථ.) | | |
| 1/13 | | | | 10 (කඩකුලී) | 7 (ප්‍රාග්ධන යෙදවීම්) |
| 1/14 | | 20 | | | |

iii. 2019 ජනවාරි 10 දින රු. 50 000 ක කාර්යාල උපකරණ දඹුලු ලී බඩු සමාගමෙන් ණයට මිල දී ගෙන ඇත.

iv. බැංකු ණය ආපසු ගෙවීම් තුළ ඇතුලත් ණය පොළිය රු. 2 000 කි.

අවශ්‍ය වන්නේ,

1. මුදල් ලැබීම් හා ගෙවීම් ජ'නල
2. ගැනුම් හා විකුණුම් ජ'නල
3. පොදු ජනලය (ලෙජරයට මාරු කිරීමේ සටහන් ද ඇතුළුව)
4. 2019. 01. 14 දිනට, වෙළඳ ලැබිය යුතු දෑ
   වෙළඳ ගෙවිය යුතු දෑ
   ගෙවිය යුතු VAT

06. අ. සීමිත ලහිරු පොදු සමාගමේ 2018. 03. 31 න් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය පමත පරිදි වේ.

ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | රු. 000 |
|---|---|
| විකුණුම් | 8 500 |
| විකුණුම් පිරිවැය | (5 300) |
| දල ලාභය | 3 200 |
| වෙනත් ආදායම් | 100 |
| | (3 300) |
| බෙදාහැරීමේ වියදම් | (2 300) |
| පරිපාලන වියදම් | (550) |
| මූල්‍ය වියදම් | (70) |
| බදු පෙර ලාභය | 380 |
| ආදායම් බදු | (220) |
| කාලච්ඡේදයේ ලාභය | 160 |

2017. 03. 31 හා 2018. 03. 31 දිනට උපුටාගත් සංක්ෂිප්ත මූල්‍ය තත්ව ප්‍රකාශය පහත පරිදි වේ.

| | 2018. 03. 31 | 2017. 03. 31 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| දේපල පිරියත හා උපකරණ | | |
| (ධාරාණ අගය) | 3 800 | 4 000 |
| තොගය | 600 | 350 |
| ණයගැතියෝ | 430 | 540 |
| ඉදිරියට ගෙවූ මෙහෙයුම් වියදම් | 30 | 65 |
| භාණ්ඩාගාර බිල්පත් | 80 | 100 |
| බැංකු | 20 | - |
| මුදල් | 70 | 85 |
| | 5030 | 5140 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 3 600 | 3 300 |
| රඳවාගත් ඉපයුම් | 250 | 150 |
| බැංකු ණය | 700 | 900 |
| ණයහිමියෝ | 150 | 180 |
| ගෙවිය යුතු ආදායම් බදු | 110 | 80 |
| උපචිත මෙහෙයුම් වියදම් | 220 | 150 |
| බැංකු අයිරාව | - | 380 |
| | 5030 | 5140 |

අතිරේක තොරතුරු,

1. 2018. 03. 31 දින එදිනට ධාරණ අගය රු 800 000 ක් වූ යන්ත්‍රයක් විකුණන ලද අතර එයින් ලද ලාභය ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදාම් ලෙස ඇතුලත් කර ඇත.
2. 2018. 03. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍ෂයවීම් රු. 280 000 කි.
3. වර්ෂය තුල දී සමාගම විසින් කොටස් හිමියන්ට අතුරු ලාභාංශ ගෙවා ඇත.
4. මුළු විකුණුම්වලින් 60% ක් අත්පිට විකුණුම් වන අතර සියළු ගැනුම් ණය පදනම මත සිදු කර ඇත.
5. වර්ෂය තුල බැංකු ණය වාරිකය රු. 470 000 ගෙවූ අතර එයින් රු. 70 000 ක් ණය පොලිය වේ. මූල්‍ය වියදම තුල නියෝජනය වන්නේ මෙම ණය පොලියයි.

අවශ්‍ය වන්නේ,

1. L. K. A. S. 07 අනුව සෘජු ක්‍රමය භාවිත කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරන්න.

(ලකුණු 10)

www.artsapi.lk

ආ.
- මතුගම ප්‍රාදේශීය සභාවේ සුහසාධක සංගමය මියුරු ගී සර නම් සංගීත වැඩ සටහන් පැවැත්වීමට සැලසුම් කරමින් සිටී.
- පුද්ගලයින් 1000 දෙනෙකු සංගීත වැඩ සටහනට සහාභාගී වේ යැයි අපේක්ෂා කෙරේ. එක් අයෙකුට රු. 1 000 ප්‍රවේශ පත්‍ර ගාස්තුවක් අය කරයි.
- ප්‍රාදේශීය සභා සුභ සාධක සංගමයට පහත වියදම් දැරීමට සිදුවේ.
- ශාලාව සඳහා කුලිය රු. 10 000 ක් ද, සංගීත කණ්ඩායමට රු. 10 000 ක් ද ප්‍රචාරණ වියදම රු. 5 000 ක් ද වේ.
- එක් අයෙකු සඳහා සංයුක්ත තැටියක්, සමරු පොතක් මෙන්ම සිහිවටනයක් ද ලබා දීමට රු. 500 ක් වැය වේ.
- සැරසිලි සඳහා රු. 4 000 ක් ද ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා රු. 2 000 ක් ද වෙනත් ස්ථාවර වියදම් සඳහා  සඳහා රු. 9 000 වැය වේ.

අවශ්‍ය වන්නේ,

1. එක් ප්‍රේක්ෂකයකුටය අදාළ සහභාගය ගණනය කරන්න.
2. සමච්ඡේදන ලක්ෂ්‍යය වටිනාකම හා පුද්ගල සංඛ්‍යාව
3. ආරක්ෂක අන්තිකය වටිනාකම
4. පුද්ගලයින් 1 000 දෙනෙකුටසහභාගී වේ යැයි උපකල්පනය කර ලාභය දක්වෙන මෙහෙයුම් ප්‍රකාශනය පිළියෙල කරන්න.
5. පුද්ගලයින් 900 දෙනෙකු පමණක් මෙම වැඩ සටහනට සහභාගී වන්නේ නම් ඉහත (4) හි ගණනය කළ ලාභය මත බලපෑම ගණනය කරන්න.

(ලකුණු 10)

www.artsapi.lk